C 338.4 DAY



# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ආර්ථික විද්‍යා අංශයේ, දර්ශනපති උපාධිය සඳහා එහි කොටසක් වශයෙන් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණාත්මක ස්වාධීන නිබන්ධය.

ඕ.ජී. දයාරත්න බණ්ඩා

පර්යේෂණ අධීක්ෂක,
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය රතිල් අභයසේකර මහතා.

2000

## සංක්ෂිප්තය

වර්තමාන අධ්‍යයනය මගින් අවධානය යොමු කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ විවිධ පරිමාණවලට අයත් කාර්මික ව්‍යවසායයන්හි වර්ධන ක්‍රියාවලිය පිළිබඳව විග්‍රහ කිරීම කෙරෙහිය. සාමාන්‍යයෙන් ව්‍යාපාර ආයතන සූක්ෂම, කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ යන කාණ්ඩ හතරකට වෙන් කෙරේ. මෙම බෙදීම සඳහා පදනම් වන්නේ ව්‍යාපාර ආයතනවල ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය සහ /හෝ සේවා නියුක්ත මට්ටමයි. සාමාන්‍යයෙන් ව්‍යාපාර ආයතනවල වර්ධන ක්‍රියාවලිය සහ ඒවායේ කාර්යභාරය මෙම බෙදීම් පදනම් කර ගෙන කරනු ලබන බව පෙනේ. කෙසේ වෙතත් වර්තමාන අධ්‍යයනයේදී සූක්ෂම පරිමාණ ව්‍යවසායයන් සැලකිල්ලට නොගැනේ. එයට හේතුව එම ව්‍යාපාර පිළිබඳ දත්ත කාලශ්‍රේණි පදනමක් මත ලබා ගැනීමට නොහැකි වීමයි. ව්‍යාපාර ආයතනවල වර්ධනය පිළිබඳ සාමාන්‍යයෙන් පවතින මතයක් වන්නේ කුඩා පරිමාණ ව්‍යාපාර දිගුකාලයේ ගතික වෘද්ධි ක්‍රියාවලියක් පවත්වා නොගන්නා බවයි.

මෙම අධ්‍යයනය මගින් කුඩා ව්‍යාපාරවල වර්ධන ක්‍රියාවලිය මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපාර ආයතනවල වර්ධන ක්‍රියාවලිය සමග සන්සන්ධනාත්මකව අධ්‍යයනය කෙරේ. වර්තමාන අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු කිහිපයකි එනම්: (1) ශ්‍රී ලංකාවේ කුඩා සහ මහා පරිමාණ අංශයේ කර්මාන්තවල නිමවුමේ නිශ්චායක හඳුනා ගැනීම. (2) කුඩා පරිමාණ කාර්මික අංශය වර්ධන උපනතියක් පෙනවා තිබේ ද. යන අරමුණු කර්මාන්ත පදනම් කර ගෙන අධ්‍යයන කර එම උපනතීන් හා ආයතනවල උපනතීන් අතර සහසම්බන්ධතාවක් තිබේ ද යන්න විමර්ෂණය කිරීම. ආයතන මට්ටමේ උපනතීන් ගවේශනය කිරීම සඳහා පහත ද අරමුණු කිහිපයක් ඇත. එනම් (1) විවිධ පරිමාණ පංතිවලට අයත් සියලුම ආයතනවලට පොදු වෘද්ධි වේගයක් පවතින්නේ ද යන්න අධ්‍යයනය කිරීම; (2) කාර්මික ව්‍යවසායවල වර්ධනය සහ ඒවායේ පරිමාණය අතර ක්‍රමානුකූල සම්බන්ධතාවක් තිබෙන්නේ ද යන්න ගවේශනය කිරීම සහ (3) විවිධ පරිමාණ පංතිවලට අයත් කාර්මික ව්‍යවසායයන් නිර්බාධ ආර්ථික ප්‍රතිපත්ති යටතේ වර්ධනය වී ඇති ආකාරය විමර්ශනය කිරීම යනුවෙනි. මේ සඳහා ප්‍රධාන උපන්‍යාස දෙකක් ගොඩ නගන ලදි.

දියුණු වන රටවල ආර්ථික සංවර්ධන ක්‍රිවයාවලියේදී කුඩා ව්‍යාපාර වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව ප්‍රකාශිතයි. සාර්ථකව ක්‍රියාත්මක වන කුඩා පරිමාණ ව්‍යාපාර දියුණු රටවල ද අවිච්ඡින්නව පවතිනු දැකිය හැකිය. ප්‍රාග්ධනය හිඟ, ශ්‍රම බහුල , පහත් තාක්ෂණික මට්ටම් සහිත සහ පහත් නිපුනතා මට්ටම්වලින් යුත් ආර්ථිකවල කුඩා ව්‍යාපාර

වැදගත් කාරර්යභාරයක් ඉටු කරන බව පෙනේ. කුඩා ව්‍යාපාරවල ආර්ථිකමය තාර්කිකභාවය මෙම අධ්‍යයනයේදී විමර්ශනය කෙරේ. කාර්මික ව්‍යවසායයන්හි වර්ධනය කෙරෙහි එම ආයතනවල අභ්‍යන්තර සාධක පමණක් නොව එම ආයතනවල මෙහෙයුම කෙරෙහි බලපාන ඒවාට බාහිර සාධක ද හේතු වේ. ව්‍යාපාර ආයතනයක වර්ධනයට හෝ පිරිහීමට හෝ පවතින ප්‍රස්ථාවන් ප්‍රධාන වශයෙන් තීරණය වන්නේ ලාභදායීත්වය මතය. ලාභදායීත්වය සාධක කිහිපයක් මගින් තීරණය වේ. එනම් කළමනාකරණයේ ගුණාත්මක බව, විශේෂිත යෙදවුම් භාවිතය, දේශපාලන පරිසරය, රාජ්‍ය ප්‍රතිපත්ති සහ තාක්ෂණික මට්ටම් ආදී වශයෙනි. මෙම එක් එක් සාධක ආයතනයේ පරිමාණයට සංවේදී වන්නේ නම් විවිධ පරිමාණවලට අයත් ව්‍යාපාර ආයතනවල වර්ධන වේගයන්හි වැදගත් වෙනස්කම් පැවතිය හැකිය. ව්‍යාපාර ආයතනවල වර්ධන ප්‍රස්ථා සහ සංරෝධක පිළිබඳ විමර්ශනයක් ද මෙම අධ්‍යයනයට ඇතුලත්ය. කෙසේ වෙතත් ප්‍රවර්ධන අධ්‍යයනයේ ප්‍රවේශ්‍ය වන්නේ මෙම එක් එක් සාධක ව්‍යාපාර ආයතනවල වර්ධනයට බලපාන ආකාරය විග්‍රහ කිරීමට නොව ව්‍යාපාර ආයතනවල පරිමාණය සහ වර්ධනය අතර පැවතිය හැකි සම්බන්ධතාව ගවේශනය කිරීම මගින් කුඩා මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපාරවල වර්ධන ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනය කිරීඹ සඳහාය. එමෙන්ම නිදහසින් පසු කාලපරිච්ජේදයේ ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ විමසුමක් ද මෙම අධ්‍යයනයට ඇතුලත්ය. එමගින් කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපාරවල සාපේක්ෂ වැදගත්කම සහ ඒවායේ කාර්යභාරය පිළිබඳව ඇගයීමක් කළ හැකිය.

ශ්‍රී ලංකාවේ කාර්මික ව්‍යවසායයන්හි ප්‍රාග්ධන දත්ත කාලශ්‍රේණි පදනමක් මත මෙම විග්‍රහයට යොදා ගැනේ. කුඩා සහ මාහ පරිමාණ අංශයේ කාර්මික නිමවුමේ නිශ්චායක ප්‍රතිපායනය කරන ලදි. එමෙන්ම කාර්මික අංශයේ ක්‍රියාකාරී දත්ත පදනම් කර ගෙන කුඩා පරිමාණ සහ මහා පරිමාණ කාර්මික ආයතනවල උපනතීන් හඳුනා ගැනේ. ව්‍යාපාර ආයතනවල පරිමාණය සහ වර්ධනය අතර සම්බන්ධතාව පරීක්ෂා කිරීඹ සඳහා ප්‍රතිපායන විශ්ලේෂණය භාවිතා කරන ලදි. විවිධ පරිමාණවල කාර්මික ව්‍යවසායයන්වල වෘද්ධි වේගයන් අතර වැදගත් විෂමතාවන් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා F පරීක්ෂාව සහ විචලතා විශ්ලේෂණ වගු භාවිතා කරන ලදි.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මගින් නිගමන කිහිපයකට එළඹිය හැකිය. පළමුවන නිගමනය වන්නේ ශ්‍රී ලංකාවේ මහා පරිමාණ අංශයේ මෙන්ම කුඩා පරිමාණ අංශයේ ද කර්මාන්තවල නිමවුමේ නිශ්චායක සමහර ව්‍යතිරේකයන්ට යටත්ව සමාන බවයි. දෙවනුව, පසුගිය දහක දෙක තුළ ශ්‍රී ලංකාවේ මහා පරිමාණ කාර්මික අංශය පමණක් නො කුඩා පරිමාණ කර්මාන්ත ද වර්ධන උපනතියක් පෙන්වා ඇත. තෙවනුව, ව්‍යාපාර ආයතනවල වර්ධනය සහ ඒවායේ පරිමාණය අතර කිසිඳු ක්‍රමානුකූල සම්බන්ධතාවක් නොමැති බවයි.

සිව්වැන්න වන්නේ විවිධ පරිමාණවලට අයත් ව්‍යාපාර ආයතනවල වර්ධන වේගයන් අතර වැදගත් වෙනස්කම් නොමැති බවයි. පස්වන නිගමනය වන්නේ කුඩා ව්‍යාපාර ද දිගුකාලයේ මහා පරිමාණ ආයතනවලට මෙන්ම වර්ධනය විය හැකි බවයි. අවසාන වශයෙන් නිර්බාධ වෙළඳ ප්‍රතිපත්ති යටතේ වුවද කුඩා ව්‍යාපාර වර්ධනය වී ඇති බවයි. අධ්‍යයනයේ නිගමන මගින් සනාථ වන්නේ කුඩා ව්‍යාපාර අංශය ද ශ්‍රී ලංකාවේ කාර්මික ප්‍රතිපත්තිය තුළ වැදගත් අංශයක් බවට පත් කළ යුතුව ඇති බවයි.